# හෙන්රි රාජකරුණාගේ ඡායාරූප කලාව : රෝලන්ඩ් බාත්ගේ ඡායාරූපාත්මක පණිවිඩය පිළිබඳ සංඥාර්ථවේදී විමසුමක්.

**ශාන්ත ගුණරත්න**
gunaratneshantha@gmail.com
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

මෙම පර්යේෂණය මගින් කලාත්මක ඡායාරූපකරණයේ නියැලෙන ශ්‍රී ලාංකේය ඡායාරූප ශිල්පී හෙන්රි රාජකරුණාගේ නිර්මාණ, ප්‍රංශ ජාතික විචාරකයෙකු වූ රෝලන්ඩ් බාත් විසින් ඉදිරිපත් කරනු ලැබූ ඡායාරූපාත්මක පණිවිඩයේ (Photographic message) දක්වෙන අරුත් මතුකිරීමේ ක්‍රියාවලිය (Connotation procedure) පාදක කරගනිමින් විශ්ලේෂණය කෙරේ. ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනය මගින් පිරිනමනු ලබන උසස්ම සම්මානය වන MFIAP (Master FIAP) දිනාගැනීමට සමත් වූ එක ම ශ්‍රී ලාංකේය ඡායාරූප ශිල්පියා වන හෙන්රි රාජකරුණා තම ඡායාරූප දිවිය ආරම්භ කරනුයේ 1960 දසකයේ දී ය. නිසල ඡායාරූපය තුළ නිශ්චලත්වයේ සීමා මායිම් අබිබවා ගොස් විවිධාකාරයෙන් චලනය සටහන් කිරීම පිළිබඳ අත්හදාබැලීම් සිදු කිරීමේ පුරෝගාමියා ලෙස ද ඔහු හැඳින්විය හැකි ය. ප්‍රංශ ජාතික සාහිත්‍ය න්‍යායාචාර්යවරයෙකු, විචාරකයෙකු මෙන් ම සංඥාර්ථවේදියෙකු ලෙස ඉතා ඉහළ පිළිගැනීමකට ලක් වූ රෝලන්ඩ් බාත් (1915 - 1980) විසින් ප්‍රකාශයට පත්කර ඇති ග්‍රන්ථයක් වන 'ප්‍රතිබිම්බ-සංගීතය-පඨිතය' (Image-Music-Text) ග්‍රන්ථයේ ඡායාරූපාත්මක පණිවිඩය (Photographic message) පිළිබඳ පැහැදිලි කර ඇත. ඡායාරූපාත්මක පණිවිඩයේ දැක්වෙන අරුත් මතුකිරීමේ ක්‍රියාවලිය (Connotation procedure) පාදක කරගනිමින්, කලාත්මක මෙන් ම සෞන්දර්යාත්මක ඡායාරූප මගින් මිනිසා වෙත සමාජීය, සංස්කෘතික හා දේශපාලනික පණිවිඩ ඉදිරිපත් කළ හැකි බව හෙන්රි රාජකරුණාගේ ඡායාරූප ඇසුරින් විමසා බැලීම මෙම පර්යේෂණයේ මූලික අරමුණයි. රෝලන්ඩ් බාත් විසින් පළකරන ලද 'ඡායාරූප හා ප්‍රතිබිම්බ' පිළිබඳ දාර්ශනික මතවාද සහ ඒ සම්බන්ධව ලියවී ඇති විද්වත් මත, රාජකරුණා කලාවේදියා හා ඔහුගේ ඡායාරූප පිළිබඳ ලියවී ඇති ග්‍රන්ථ, ලිපි හා විචාර විමර්ශනය කිරීම මෙහි පර්යේෂණ ක්‍රමවේදය වේ. ඊට අමතරව ඔහුගේ නිර්මාණ ක්‍රමවේදය අධ්‍යයනයට බඳුන් කිරීමත්, කෘති අන්තර්ගතය පිළිබඳ මනෝවිද්‍යාත්මක, මානව විද්‍යාත්මක හා වින්දනාත්මක ලක්ෂණ හඳුනාගැනීමත් මෙම අධ්‍යයනය සඳහා පාදක කොටගැනිණි. මෙහි දී අංග හයකින් යුතුව ඉදිරිපත් කර ඇති බාත්ගේ අරුත් මතුකිරීමේ ක්‍රියාවලියෙහි එන ප්‍රයෝග ආවරණ (Trick effects)" ඉරියව් (Pose)" අරමුණු (Objects), ඡායාරූපාත්මක සුන්දරත්වය (Photogenia), තාක්ෂණික ආවරණයන් (Technical effects), සෞන්දර්යාත්මක බව (Aestheticism) සහ ඡායාරූප ගණනාවක් එකට ඇමිණීමෙන් ඇතිවන අනුපිළිවෙළ (Syntax) යන න්‍යායන් රාජකරුණාගේ නිර්මාණ භාවිතය තුළ පැහැදිලි ලෙස අන්තර්ගත වන බව හඳුනාගැනිණි. එනම් හෙන්රි රාජකරුණා යථාව ඡායාරූපමය යථාර්ථයක් වශයෙන් ඉදිරිපත් කිරීමේ දී, බාත්ගේ අරුත් මතුකිරීමේ ක්‍රියාවලිය හා අනුරූප වන කාලීන සමාජීය, සංස්කෘතික හා දේශපාලනික අරුත් සංඥාර්ථවේදී ආකාරයෙන් මතුකරන බව මෙම අධ්‍යයනයෙන් සනාථ කළ හැකි විය.

**ප්‍රමුඛ පද :** ඡායාරූපාත්මක පණිවිඩය; සංඥාර්ථවේදය; මුඛ්‍යාර්ථය; අරුත් මතුකිරීමේ ක්‍රියාවලිය; සෞන්දර්යාත්මක බව